# <u>නිවේදනය</u> B

**"ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය (සංස්ථාගත කිරීමේ)"** නමැති පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත සම්බන්ධයෙන් නිවේදනයක් කිරීමට කැමැත්තෙමි.

පාර්ලිමේන්තු මන්ත්‍රිනී ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය විසින් 2019 ජූලි 11 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද මෙම පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154උ (5) (අ) ව්‍යවස්ථාව ප්‍රකාරව සෑම පළාත් සභාවකටම යොමු කර ඇති අතර, ඒ ඒ පළාත් සභාවේ අදහස් 2019 සැප්තැම්බර් 11 දිනට ප්‍රථමව පාර්ලිමේන්තුවට එවන ලෙස පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 51 (2) (අ) යටතේ ඉල්ලා සිටින ලදී.

ඌව පළාත් සභාව විසින් දන්වා ඇත්තේ පනත් කෙටුම්පත එකී පළාත් සභාවේ බහුතර ඡන්දයෙන් ප්‍රතික්ෂේප වී ඇති බවයි.

අනෙකුත් සියලු පළාත් සභා විසුරුවාහැර ඇති අතර බස්නාහිර සහ දකුණු යන පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන් විසින් දන්වා ඇත්තේ එකී පළාත් සභා විසුරුවා හැර ඇති බැවින් පනත් කෙටුම්පත පිළිබඳ සිය මතයන් ඉදිරිපත් කිරීමට හැකියාවක් නොමැති බවයි.

එසේ වුවද, උතුරු පළාත් සභාවේ අණ්ඩුකාරවරයා සහ සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම් විසින් මේ සම්බන්ධයෙන් සිය මතයන් දන්වා එවා ඇතිමුත් එම දැනුම්දීම් ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ දක්වා ඇති ක්‍රියාපටිපාටිය අනුව විධිමත්ව සිදු කර නොමැත.

නැගෙනහිර, වයඹ, මධ්‍යම සහ උතුරු මැද යන පළාත් සභා විසින් ප්‍රතිචාර දක්වා නොමැත.

පළාත් සභා විසින් දන්වා ඇති අදහස් කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය වෙත යොමු කළ යුතුයැයි නියෝග කරමි.